# අකීකරු කුරුළු පැටියා



තෙහන්සා වර්ණකුලසූරිය

# අකීකරු කුරුළු පැටියා

**තෙහන්සා වර්ණකුලසූරිය**

# අකීකරු කුරුඹි පැටියා

කර්තෘ : තෙහන්සා වර්ණකුලසූරිය

ප්‍රථම මුද්‍රණය : 2023

ISBN : 978-624-208-065-9

මුද්‍රණය : ගේට්වේ කොමියුනිකේෂන්, මහනුවර

# පිදුම

මාගේ මෙම පොත මහාමායා බාලිකා

මහා විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ

විදුහල්පතිතුමිය සහ මාගේ පන්තිභාර

ගුරුමෑණියන්ට සහ මා හට අකුරු

කළ ගුරු මෑණිවරුන්ට ඉතා

ආදරයෙන් හා ගෞරවයෙන් පුද කරමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 - 11 - 01

දසුනිලාගේ ගෙදර වත්තේ ලොකු මාර ගහක් තිබුණා. ඒ මාර ගහේ ලස්සන පොඩි කුරුළු කූඩුවක් තිබුණා. මේ කුරුළු කූඩුවේ අම්මයි තාත්තායි පැටව් තුන්දෙනයි ජීවත් වුණා.



මේ කුරුළු අම්මයි තාත්තායි හැමදාම පැටව් තුන්දෙනා කූඩුවේ තනියම දාලා තමයි කෑම හොයන්න යන්නේ.



දවසක් මේ අම්මයි තාත්තයි කෑම හොයා ගන්න ගිය වෙලාවක් බලලා පොඩි කුරුළු පැටියා අනෙක් පැටවුන්ට මෙහෙම කිව්වා. "දැන් අම්මයි තාත්තයි කූඩුවේ නෑනේ. අපි පොඩ්ඩක් එහාට මෙහාට ඉගිළිලා බලමුද ?"



අනෙක් පැටව් දෙන්නා කියනවා "අනේ අනේ අපිට නම් බෑ අම්මයි තාත්තායි ආවොත් අපිට බනියි. ඒ දෙන්නා නැති වෙලාවේ අපි පියාඹන්න යන එක හරි නෑ" කියලා අනෙක් පැටව් දෙන්නා කිවුවා.



ඒත් මේ පොඩි පැටියා මේ කිසි දෙයක් කනට ගත්තේ නෑ. ඌ තනියම ඉගිලිලා ගියා. හරිම හිතුවක්කාර පැටියෙක්. අනෙක් පැටවුන් දෙදෙනා හිතුවා. මේ පොඩි පැටියා අහසේ එහාට මෙහාට ඉගිළුනා හරිම ආශාවෙන්.



පැටියාට වැඩිදුරක් ඉගිලෙන්න බැරි වුනා. ලොකුම ලොකු උකුස්සෙක් පැටියා පස්සෙන් ඉගිළිලා ආවා.



කුරුළු පැටියා බයවුණා. උඵ හයියෙන් කෑගහන්න ගත්තා. මේ සද්දේ ඇහුණු කුරුළු අම්මයි තාත්තයි එතැනට ආවා.



කුරුළු පැටියාව බේරා ගෙන නැවත කූඩුවටම අරන් ගියා. අම්මයි තාත්තයි ආවේ නැත්නම් තව මොහොතකින් කුරුළු පැටවාගේ ජීවිතය නැතිවෙන්න පවා ඉඩ තිබ්බා. කුරුළු අම්මයි තාත්තයි මේ කුරුළු පැටියාට අවවාද දුන්නා, ආයේ තනියම යන්න එපා කියලා.



අපිත් හිතා ගන්න ඕනේ වැඩිහිටියන් කියන දේ අහගෙන කීකරුව ජීවත් වෙන එක හරිම හොඳ ගති ගුණයක් බව.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඍදුපිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු .

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023 - 11 - 01